# වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
## ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
## පොල්ගොල්ල

NICD SRI LANKA

# පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

2001 අංක 01 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කර ඇති මහනුවර, පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පහත පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. පුරප්පාඩු තනතුරු

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගනු ලබන පදනම |
|---|---|---|---|
| 01. | ලේඛකාධිකාරී | 01 | කොන්ත්‍රාත් / ද්වීතියික |
| 02. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 02 | කොන්ත්‍රාත් / ද්වීතියික |
| 03. | අලෙවි ප්‍රවර්ධන හා මුද්‍රණ නිලධාරී | 01 | කොන්ත්‍රාත් |
| 04. | මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණ සහකාර | 01 | කොන්ත්‍රාත් / පැවරුම් |

### 2. සෑම අයදුම්කරුවෙක්ම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

### 3. සේවා නියුක්ති කිරීමේ කොන්දේසි

i. බඳවා ගන්නා සෑම තනතුරකට අදාළ නිත්‍ය සේවා ස්ථානය පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය වන අතර සේවයේ අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටුකිරීම කළ යුතු වේ.

### 4. සුදුසුකම් ලබන දිනය

තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

### 5. අයදුම් කළ යුතු ආකාරය

ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේදී සලකා බලනු ලබන සුදුසුකම් හා ඊට අදාළ සියලු විස්තර ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ **www.nicd.edu.lk** යන නිල වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් ලබා ගත හැකිය.

i. පුවත්පත් දැන්වීමට අනුව මෙම ආයතනයේ නිල වෙබ් අඩවියේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මඟින් තනතුරු සඳහා අයදුම් කළ යුතු අතර, අයදුම්පත්‍රයේ සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

ii. තවද දැනටමත් රජයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතන/ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

iii. අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත් භාර ගැනීම **2026.03.31** දිනෙන් අවසන් වන අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එදිනට හෝ එදිනට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

v. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, මූලික සුදුසුකම් සපුරා නොමැති හා මූලික සුදුසුකම් සපුරා ඇති බවට සහතික පිටපත් මඟින් සනාථ කර නොමැති, නිසි පරිදි ඉදිරිපත් නොවූ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi.. තනතුරුවලට බඳවා ගැනීමට කවරාකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**සැ.යු.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඉහත බඳවා ගැනීම්වලට අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් යම් සංශෝධනයක් සිදු වුවහොත් ආයතනික නිල වෙබ් අඩවියේ ඒ බව යාවත්කාලීන කරනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,**
**පොල්ගොල්ල.**
**2026.03.13**